# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
# දැන්වීමයි

## 2022 අධ්‍යයන වර්ෂයට උපාධි පාඨමාලා (බාහිර) සඳහා ලියාපදිංචි කිරීම

පහත සඳහන් උපාධි පාඨමාලා සඳහා 2022 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි කිරීමට තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛනය අපගේ වෙබ් අඩවියේ (www.cdce.kln.ac.lk) **2023 මාර්තු 13 දින** පළකිරීමට නියමිතය.

| පාඨමාලාව | පාඨමාලා ගාස්තුව (මෙය වාරික 05කින් ගෙවීම් කළ හැකිය) | ලියාපදිංචි කරගැනීම සඳහා වන පළමු වාරිකය |
|---|---|---|
| **ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව - 2022 අධ්‍යයන වර්ෂය** | **රු. 120,000.00** | **රු. 25,000.00** |
| **වාණිජ විද්‍යාවේදී විශේෂ (බාහිර) උපාධි පාඨමාලාව - 2022 අධ්‍යයන වර්ෂය** | **රු. 162,500.00** | **රු. 44,000.00** |
| **ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව - 2022 අධ්‍යයන වර්ෂය** | **රු. 86,000.00** | **රු. 15,000.00** |

ලියාපදිංචිවීම සඳහා පළමු වාරිකය ගෙවිය යුතු අතර ඒ සඳහා පහත මාර්ගෝපදේශ අනුගමනය කරන්න.

1. මුලින්ම අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න. එහි **"New Registration"** නැමති අයිතමය තෝරාගන්න.
2. ඉන්පසු ඔබගේ අයදුම්පත් අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
3. එවිට ඔබට හිමි වවුචර්පත, ප්‍රකාශන පත්‍රය සහ නම, ලිපිනය, අදාළ පාඨමාලාව සඳහන් පත්‍රිකාව මෙන්ම වාරික ගෙවීම් පිළිබඳ විස්තර පත්‍රිකාව දිස්වනු ඇත. එම පත්‍රිකාවේ සඳහන් තොරතුරු නිවැරදි බව ඔබ විසින් තහවුරු කිරීමෙන් පසු ඔබගේ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් උඩුගත (Upload) කරන්න. ඉන් පසු ඉහත ලේඛන බාගත (Download) කරගන්න.
4. වවුචරයේ සඳහන් උපදෙස් අනුව එහි සඳහන් මුදල වවුචරයේ සඳහන් **ගිණුම් අංකයට පමණක්** ගෙවිය යුතුය.
5. පළමු වාරික මුදල මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට **2023.04.12** දිනට පෙර ගෙවිය යුතුය. **(කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ගිණුමට බැර කරනු ලබන කිසිඳු මුදලක් ආපසු ගෙවනු නොලැබේ.)**
6. මෙම දිනට හෝ ඊට පෙර ගෙවීම් නොකරන අපේක්ෂකයින් ලියාපදිංචිය සඳහා සලකා බලනු නොලැබේ.
7. මුදල් ගෙවීමෙන් පසුව බැංකුව විසින් ඔබ වෙත ලබාදෙනු ලබන කහ පැහැති පාරිභෝගික පිටපත සමග නිසි පරිදි අත්සන සහතික කරන ලද ප්‍රකාශන පත්‍රය, නිරවද්‍යතාවය තහවුරු කරන ලද තොරතුරු අඩංගු පත්‍රිකාව, පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02ක් සහ පහත ලේඛනවල සහතික කළ ඡායා පිටපත් අනිවාර්යයෙන් එවිය යුතුයි.

- **උප්පැන්න සහතිකය**
- **ජාතික හැඳුනුම්පතේ පිටපතක්**
- **අ.පො.ස (සා.පෙළ) සහතික**
- **අ.පො.ස (උ.පෙළ) සහතික**
- **වෙනත් සුදුසුකම් යටතේ ලියාපදිංචි වන්නේ නම් එම සහතික**
- **පූජ්‍ය පක්ෂය සඳහා සාමණේර හෝ උපසම්පදා සහතිකය.**

**තව ද උප්පැන්න සහතිකයේ සඳහන් නම සහ අධ්‍යාපන සහතිකවල සඳහන් නම අතර වෙනසක් පවතින්නෙ නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.**

**ප්‍රකාශන පත්‍රයේ අත්සන සහ ලේඛනවල ඡායා පිටපත් සහතික කිරීම**

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරි / සාමදාන විනිශ්චයකාරවරයෙකු / නීතීඥවරයෙකු හෝ ඉහත තනතුරු දරණ රජයේ පිළිගත් ආයතනයක මාණ්ඩලික නිලධාරියෙකු විසින් සිදුකල යුතුය.

9. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"Registration - 2022"** ලෙස සඳහන් කර **2023.04.28** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට කටයුතු කරන්න.

**ලිපිනය :-** **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,**
**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,**
**තැ.පෙ. 03,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**
**කැලණිය.**

10. ඔබ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන්නේනම් ඔබට ලබා දී ඇති විෂයයන් සඳහා බාහිර උපාධි අපේක්ෂකයින් අවම වශයෙන් 20 දෙනෙකවත් ලියාපදිංචි නොවුනහොත් ඔබට ලබා දිය හැකි වෙනත් විෂයයක් සඳහා ලියාපදිංචිවීමට සිදු වන බව දන්වමි.

ඔබ ලබා දී ඇති තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත් වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කරන බව දන්වන අතර ගෙවා ඇති කිසිඳු මුදලක් ආපසු නොගෙවන බව ද වැඩිදුරටත් දන්වමි.

**ඉහත දක්වා ඇති බාහිර උපාධි පාඨමාලාවන් සඳහා අයදුම්කිරීමට නොහැකි වූ අපේක්ෂකයින් සඳහා 2023 මාර්තු මස 13 සිට 20 වන දින දක්වා අපගේ වෙබ් අඩවියට පිවිස අයදුම්පත් ඉදිරිපත් කළ හැක.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය.
කැලණිය විශ්වවිද්‍යාලය
2023.03.09